# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 168 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 29/01/2024 පැය 0850

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2024.01.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| **04** | **04** | **25** | **1355** | ගෑස් ලිප්<br>ගෑස් සිලින්ඩර්<br>තඹ දඟර **02** |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. ගංජා හේන් 04 වැටලීම - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.01.23 හා 2024.01.24 යන දිනයන් හිදී කතරගම පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් විසින් ඩ්‍රෝන යානා මගින් ලබා ගත් වීඩියෝ දර්ශන මත වැටලීම් සිදු කර ගංජා **හේන් 04 ක් වැටලීම් කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගෙන නොමැති අතර, හේන් 04 තුල ගංජා ගස් 726,050 තිබී ඇති අතර, ගිනි තබා විනාශ කර ඇත.**

**03. නීති විරෝධි ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් 14 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.01.28 වන දින සවස් කාලයේ කහවත්ත පොලිස් වසමේ නීලගම හා කට්ටංගේ ප්‍රදේශවල දී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීම් 04 ක් සිදු කර බලපත්‍ර නොමැතිව **නීති විරෝධී ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් 14 දෙනෙකු හොයිස්ටර් 02 ක්, එස්කැවේටර් යන්ත්‍රයක් සහ කැණීම් උපකරණ සමඟ** අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19 ත් 63 ත් අතර වයස්වල පසුවන කහවත්ත, අටකලන්පන්න, රත්නපුර හා කුරුවිට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර**

2024.01.28 වන දින උදෑසන කාලයේ සියඹලාණ්ඩුව පොලිස් වසමේ 03 වන ගම්මානය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** අත්අඩංගුවට ගෙන සියඹලාණ්ඩුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත. සියඹලාණ්ඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.